## පොරතිවු පත්තු ප්‍රාදේශීය සභාව

## මඩකලපුව දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 21 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2010 පෙබරවාරි 22 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**1:2 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව පොරතිවු පත්තු ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට පොරතිවු පත්තු ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

**1:3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**1:3:1 අනුකූල නොවීම්**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති , රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 137 හා 138 | වගකිව යුතු නිලධාරියකු විසින් සහතික කිරීමකින් තොරව විවිධ කාර්යයන් සඳහා රු.3,574 ක මුදලක් ගෙවා තිබුණි. |
| (ආ) | නැගෙනහිර පළාත් මුදල් රීති අංක 73 | සිවිල් යුද්ධය හේතුවෙන් විනාශ වූ රු.2,525,601 ක් වූ වත්කම් ලියා හැරීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | අංක 273 | මාස 6 ක් ඉක්මවූ රු.14,996 ක උපලබ්ධි නොවූ චෙක්පත් පිළිබඳ පියවර ගෙන නොතිබුණි. |
| (ඈ) | විශේෂ ගැසට් නිවේදනය උතුරු - නැගෙනහිර පළාත් රීති 3 (1) | මාසික සභා රැස්වීම් වලට සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ට රු.10,000 ක මුදලක් ගෙවා තිබුණි. |
| (ඇ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 වගන්තිය | ගෙවීම් වලින් 5% ක් වූ රඳවා ගැනීම් බදු රු.6,774 ක් අයකර නොතිබුණි. |
| (ඉ) | 2006 අංක 12 දරන මුද්දර බදු පනත | පාර්ශ්‍රමික වලින් රු.325 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. |
| (ඊ) | 1992 සැප්තැම්බර් 30 දිනැති අංක 1769 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට රු.63,801 ක් වූ සැලසුම් ඇඳීම ගාස්තු ගෙවා තිබුණි. |
| (උ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 3.9.1 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට පටහැනිව වටිනාකම රු.2,500,000 ක් වූ සිවිල් වැඩ ප්‍රදානය කර තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2:1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.4,283,242 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවරතන වියදම රු.3,779,358 ක් විය.

### 2:2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම, හිඟ ආදායම

සභාපති විසින් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත අදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| ආදායම් විෂයය | | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ |
|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | - | - | 31 | - | - | - |
| (ii) | බදු කුලී | 486 | 508 | - | 203 | 185 | 42 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 190 | 190 | - | 1,374 | 1,374 | - |
| (iv) | වෙනත් ආදායම් | 1,141 | 1,637 | - | 2,981 | 2,485 | 515 |

## 2:3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ ඇස්තමේන්තුගත වියදම, තථ්‍ය වියදම හා විචලනය පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පුනරාවර්තන වියදම | | | | | | |
| පුද්ගලික පඩිනඩි | 9,275 | 8,262 | 1,013 | 8,158 | 7,698 | 460 |
| වෙනත් | 2,124 | 5,337 | (3,213) | 2,251 | 8,250 | (5,999) |
| උප එකතුව | 11,399 | 13,599 | (2,200) | 10,409 | 15,948 | (5,539) |
| මූලධන වියදම | 2,250 | 17,796 | (15,546) | 2,300 | 15,577 | (13,277) |
| මුළු එකතුව | 13,649 | 31,395 | 17,746 | 12,709 | 31,525 | (18,816) |

## 2:4 මානව සම්පත් කළමනාකරණය

### අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය

සභාවේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | 2010 දෙසැම්බර් 31 දිනට අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | 01 | 01 |
| ද්විතීය ශ්‍රේණිය | 15 | 12 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 19 | 19 |
| වෙනත් (අනියම් / තාවකාලික) | - | 10 |
| | 35 | 42 |

2:5 **වත්කම් කළමනාකරණය**

2:5:1 **ලැබිය යුතු ගිණුම්**

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ රු.1,366,739 ක් විය.

2:5.2 **අයවිය යුතු සේවක ණය**

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 3 කට වැඩි කාලයක් ඉක්මවූ අය විය යුතු සේවක ණය ශේෂ එකතුව රු.486,297 ක් විය.

2:5:3 **සමීක්ෂණය නොකළ වත්කම්**

2010 දෙසැම්බර් 31 දිනට භෞතක පරීක්ෂණ / සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු කර නොගෙන පොත්වල දැක්වෙන ශේෂය මත ගණනය කරන ලද වත්කම්වල වටිනාකම රු.51,229,937 ක් විය.

2.6 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

රු.162,518 ක් වූ වංචාකාරීව මුදල් ආපස ගැනීම පිළිබඳව අදාල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2:7 **අභ්‍යන්තර විගණනය**

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) අභ්‍යන්තර විගණනය

(ආ) ආදායම් පරිපාලනය